# වයඹ පළාත් යන්ත්‍රෝපකරණ අධිකාරියේ
# පුරප්පාඩු තනතුරු සඳහා කාර්ය මණ්ඩලය බඳවා ගැනීම

වයඹ යන්ත්‍රෝපකරණ අධිකාරියේ පුරප්පාඩුව පවතින කළමනාකාර අධ්‍යක්ෂ, යාන්ත්‍රික ඉංජිනේරු, යාන්ත්‍රික අධිකාරී, කාර්මික සහකාර, කාර්මික, තහඩුකරු, පින්තාරුකරු, පැස්සුම්කරු, බර යන්ත්‍ර ක්‍රියාකරු, බර වාහන රියදුරු යන තනතුරු සඳහා පහත සඳහන් සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. කළමනාකාර අධ්‍යක්ෂ තනතුර (ස්ථිර) - පුරප්පාඩු සංඛ්‍යාව - 01**

**බාහිර අයදුම්කරුවන් සඳහා සුදුසුකම් -**

i. අධ්‍යාපන සුදුසුකම්
- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ප්‍රථම උපාධියක් ලබා තිබීම.

සහ

- ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම.

ii. පළපුරුද්ද
- උපාධි සුදුසුකම් ලබා ගැනීමෙන් පසුව රජයේ හෝ රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක කළමනාකාර මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර 15 ක ඉංජිනේරු සේවා පළපුරුද්දක් ලබා තිබීම.

iii. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා සුදුසුකම් -
- "කළමනාකාර" සේවා ගණයෙහි i වන ශ්‍රේණියෙහි අවම වශයෙන් වසර 05 ක අදාළ විෂය ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

iv. වයස

අවු. 40 – අවු. 55 අතර විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බලනොපායි.

v. තනතුරට අදාළ වැටුප් හා දීමනා
- HM 1-1-2025: 140,640-15X4,100-202,140 වැටුප් පරිමාණයේ 2026 වර්ෂයට අදාළ ආරම්භක වැටුප +වෘත්තීය දීමනාව+ප්‍රවාහන දීමනාව+ඉන්ධන දීමනාව + ජීවන වියදම් දීමනාව +දිරි දීමනා

**02. යාන්ත්‍රික ඉංජිනේරු තනතුර (ස්ථිර) - පුරප්පාඩු සංඛ්‍යාව - 01**

**බාහිර අයදුම්කරුවන් සඳහා සුදුසුකම්**

i. අධ්‍යාපන සුදුසුකම්
- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ඉංජිනේරු (යාන්ත්‍රික) විද්‍යාව පිළිබඳ ප්‍රථම උපාධිය ලබා තිබීම.

ii. පළපුරුද්ද
- උපාධිය ලබා ගැනීමෙන් පසු යාන්ත්‍රික ඉංජිනේරු ක්ෂේත්‍රයේ වසර 03ක සේවා පළපුරුද්ද හෝ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම.

iii. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා සුදුසුකම්
- අදාළ තනතුරට පැවරෙන විෂය ක්ෂේත්‍රයට අදාළ කනිෂ්ඨ කළමනාකාර සේවා ගණයේ i වන ශ්‍රේණියේ වසර 05ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

iv. වයස
- අවු. 22 - අවු. 45 අතර විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බලනොපායි.

v. තනතුරට අදාළ වැටුප් හා දීමනා
- MM 1-3 - 2025: 96,650-10X2,480-15X3,450-173,200 වැටුප් පරිමාණයේ 2026 වර්ෂයට අදාළ ආරම්භක වැටුප +වෘත්තීය දීමනාව +ජීවන වියදම් දීමනාව +දිරි දීමනා

**03. යාන්ත්‍රික අධිකාරී තනතුර (ස්ථිර) - පුරප්පාඩු සංඛ්‍යාව - 01**

**බාහිර අයදුම්කරුවන් සඳහා සුදුසුකම් -**

i. අධ්‍යාපන සුදුසුකම්
- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ඉංජිනේරු (යාන්ත්‍රික) විද්‍යා උපාධිය ලබා තිබීම.

ii. පළපුරුද්ද
- උපාධි සුදුසුකම් ලැබීමෙන් පසු රාජ්‍ය දෙපාර්තමේන්තුවක / සංස්ථාවක/ මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික වාණිජ ආයතනයක එක් අවුරුදු සේවා පළපුරුද්දක් ලබා තිබීම.

iii. අභ්‍යන්තර අයදුම්කරුවන් අදාළ සුදුසුකම් -
- රජයේ පිළිගත් කාර්මිකයන් පුහුණු කිරීමේ ආයතනයකින් ලබාගත් ජාතික තාක්ෂණ විද්‍යා උපාධිය සහිත අදාළ ක්ෂේත්‍රයේ වසර 06 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හෝ කළමනාකරණ සහකාර (තාක්ෂණ) සේවා ගණයේ i වන ශ්‍රේණියේ කාර්මික සහකාර තනතුරක වසර 05ක සතුටුදායක සේවා පළපුරුද්දක් සම්පූර්ණ කර තිබීම.

iv. වයස
- අවු. 22 - අවු. 45 අතර විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බලනොපායි.

v. තනතුරට අදාළ වැටුප් හා දීමනා
- JM 1-1 2025: 72,650-10X1,350-18X2,040-122,970 වැටුප් පරිමාණයේ 2026 වර්ෂයට අදාළ ආරම්භක වැටුප+ජීවන වියදම් දීමනාව +දිරි දීමනා+පැමිණීමේ දීමනා+අතිකාල දීමනා

**04. කාර්මික සහකාර තනතුර - පුරප්පාඩු සංඛ්‍යාව -02**

**බාහිර අයදුම්කරුවන් සඳහා සුදුසුකම් -**

i. අධ්‍යාපන සුදුසුකම්
- අධ්‍යයන පොදු සහතික පත්‍ර (සමාන්‍ය පෙළ) විභාගයේදී සිංහල / දෙමළ, ඉංග්‍රීසි භාෂාව, ගණිතය ඇතුලුව විෂයන් හතරකට සම්මාන සහිතව එක් වරකදී විෂයයන් හයකින් සමත් වී තිබීම.
- අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී විද්‍යා අංශයෙන් සියළුම විෂයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තෘතීය අධ්‍යාපන පාඨමාලාවක් හැදෑරීම සඳහා අවශ්‍ය සාධන මට්ටම ලබා තිබීම.

ii. තාක්ෂණික නිපුණතා / ප්‍රවීණතා
- කළමනාකරණ සහකාර (තාක්ෂණ) තනතුරෙහි තමාට පවරා ඇති කාර්ය භාරයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නියම කර ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතා (N.V.Q) 05 මට්ටමට අඩු නොවන්නාවූ මෝටර් රථ අලුත්වැඩියා, යන්ත්‍ර ශිල්පය, මෝටර් රථ විදුලි ශිල්පය හා වායු සමීකරණය කිරීම, පින්තාරු ශිල්පය හා තහඩු ශිල්පය, කම්මල් ශිල්පය යන ක්ෂේත්‍රයන්ට අදාළව තාක්ෂණික පාඨමාලාවක් සාර්ථකව හදාරා සහතික ලබා තිබීම.

iii. වයස
- අවු 18 - අවු 35 අතර විය යුතුය.

iv. තනතුරට අදාළ වැටුප් හා දීමනා
- MA 2-2-2025: 50,540-10X540-7X630-4X1,080-20X1,280-90,270 වැටුප් පරිමාණයේ 2026 වර්ෂයට අදාළ ආරම්භක වැටුප +ජීවන වියදම් දීමනාව +දිරි දීමනා+පැමිණීමේ දීමනාව+අතිකාල

**05. කාර්මික තනතුර - පුරප්පාඩු 02,**
**තහඩුකරු තනතුර - පුරප්පාඩු 01,**
**පින්තාරුකරු තනතුර - පුරප්පාඩු 01,**
**පැස්සුම්කරු තනතුර - පුරප්පාඩු 01**

**බාහිර අයදුම්කරුවන් සඳහා සුදුසුකම් -**

i. අධ්‍යාපන සුදුසුකම්
- අධ්‍යායන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී යටත් පිරිසයින් විෂයයන් දෙකක් සමත් වී තිබිය යුතුය.

ii. ශිල්පීය නිපුණතාව / ප්‍රවීණතා
- එක් එක් තනතුරෙහි කාර්ය භාරයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි 04වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම සහ අදාළ ක්ෂේත්‍රයෙහි එක් වසරක සේවා පළපුරුද්ද ලබා ගෙන තිබීම.

iii. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා සුදුසුකම් -
- අ.පො.ස. (සා.පෙ) විභාගයෙන් විෂයයන් දෙකක් හෝ ඊට වැඩි විෂයයන් ගණනක් සමත් අදාළ ක්ෂේත්‍රයෙහි වසර 05 පළපුරුද්ද සහිත රජයේ කාර්මික විද්‍යාලක් මඟින් පවත්වනු ලබන අදාළ තනතුරකට අයත් කාර්යයන්ට අදාළ 4 වැනි මට්ටමේ වෘත්තීය කාර්මික කුසලතා / ප්‍රවීණතා පරීක්ෂණයකින් සමත් වන ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයන්හි සේවකයෝ අයදුම් කිරීමට සුදුසුකම් ලබති.

iv. වයස
- අවු. 18 - අවු. 45 අතර විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බලනොපායි.

v. වැටුප් හා දීමනා
- PL-03-2025: 43,280-10X490-10X540-10X590-12X630-67,040 වැටුප් පරිමාණයේ 2026 වර්ෂයට අදාළ ආරම්භක වැටුප +ජීවන වියදම් දීමනාව +දිරි දීමනා+පැමිණීමේ දීමනාව+අතිකාල දීමනා.

**06. බර යන්ත්‍ර ක්‍රියාකරු තනතුර - පුරප්පාඩු -05 (එක්ස්කැවේටර්, ඩෝසර්, මෝටර් ග්‍රේඩර්,බැකෝ ලෝඩර්, මාර්ගතලන)**

**බාහිර අයදුම්කරුවන් සඳහා සුදුසුකම් -**

i. අධ්‍යාපන සුදුසුකම්
- අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී යටත් පිරිසෙයින් විෂයයන් දෙකක් සමත් වී තිබිය යුතුය.

ii. ශිල්පීය නිපුණතා / ප්‍රවීණතා
- ඉදිකිරීම් යන්ත්‍ර ක්‍රියාකරවීම සම්බන්ධ ජාතික ආධුනිකත්ව හා වෘත්තීය පුහුණු කිරීමේ අධිකාරිය විසින් හෝ ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනය විසින් නිකුත් කළ ජාතික වෘත්තීය කුසලතා (04) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකය ලබා තිබීම සහ අදාළ සහතිකය ලබා ගැනීමෙන් පසු අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර (03) ක පළපුරුද්ද ලබා තිබීම.

iii. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා සුදුසුකම් -
- අ.පො.ස. (සා.පෙ) විභාගයෙන් විෂයයන් 02ක් හෝ ඊට වැඩි විෂයයන් ගණනක් සමත් අදාළ ක්ෂේත්‍රයෙහි වසර 05ක පළපුරුද්ද සහිත රජයේ කාර්මික විද්‍යාලක් මඟින් පවත්වනු ලබන අදාළ තනතුරකට අයත් කාර්යයන්ට අදාළ (04) වැනි මට්ටමේ වෘත්තීය කාර්මික කුසලතා / ප්‍රවීණතා පරීක්ෂණයකින් සමත් වන ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයන්හි සේවකයෝ අයදුම් කිරීමට සුදුසුකම් ලබති.

iv. වයස
- අවු. 18 -අවු. 45 අතර විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බලනොපායි.

v. වැටුප් හා දීමනා
- PL-03-2025: 43,280-10X490-10X540-10X590-12X630-67,040 වැටුප් පරිමාණයේ 2026 වර්ෂයට අදාළ ආරම්භක වැටුප +ජීවන වියදම් දීමනාව +දිරි දීමනා+පැමිණීමේ දීමනාව+අතිකාල දීමනා.

**07. බර වාහන රියදුරු තනතුර - පුරප්පාඩු -05**

**බාහිර අයදුම්කරුවන් සඳහා සුදුසුකම්**

i. අධ්‍යාපන සුදුසුකම්
- අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී යටත් පිරිසෙයින් විෂයයන් දෙකක් සමත් වී තිබිය යුතුය.

ii. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද
- මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කළ A කාණ්ඩයේ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා ගැනීමෙන් පසු අවම වශයෙන් වසර (03) ක අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද ලබා තිබීම.

iii. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා සුදුසුකම් -
- බර වාහන රියදුරු තනතුරේ ඉහත අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද සහිත ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයන්හි සේවකයින්ට අයදුම් කිරීමට සුදුසුකම් ලබති.

iv. වයස
- අවු. 18 - අවු. 45 අතර විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

v. වැටුප් හා දීමනා
- PL-03-2025: 43,280-10X490-10X540-10X590-12X630-67,040 වැටුප් පරිමාණයේ 2026 වර්ෂයට අදාළ ආරම්භක වැටුප +ජීවන වියදම් දීමනාව +දිරි දීමනා+පැමිණීමේ දීමනාව+අතිකාල දීමනා.

➢ තනතුරෙහි/ තනතුරුවල විශේෂිත වෙනත් සුදුසුකම්

i. ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතුය. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

ii. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

iii. බාහිර අයදුම්කරුවන් අදාළ වසර (03) පරිවාස කාලයකට යටත් වන අතර, අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා වසර 01 ක වැඩබැලීමේ කාලයකට යටත් වේ.

➢ තනතුරෙහි / තනතුරුවල ස්වභාවය

සියලුම සේවකයින් සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට දායක වේ.

මෙම තනතුරු සඳහා පත් කිරීම හෝ නොකිරීම සම්බන්ධයෙන් අවසාන තීරණය වයඹ යන්ත්‍රෝපකරණ අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ.

ඔබ විසින් සකස් කළ අයදුම් පත්‍රය 2026.06.04 දිනට ප්‍රථම **"කළමනාකාර අධ්‍යක්ෂ, වයඹ යන්ත්‍රෝපකරණ අධිකාරිය, අංක 95, දකුණු රවුම්පාර, කුරුණෑගල"** යන ලිපිනයට ලියාපදිංචි තැපැල මඟින් එවිය යුතු අතර, ලියුම් කවරයේ වම්පස උඩු කෙලවරේ අයදුම් කරන තනතුරු නාමය සඳහන් කළ යුතුය.

**කළමනාකාර අධ්‍යක්ෂ,**
**වයඹ යන්ත්‍රෝපකරණ අධිකාරිය.**
**දුරකථන අංකය- 037-2222538**